# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2026.06.02


පනාගොඩගේ සුදේශ් කුමාර පෙරේරා මයා
230/1, දූලම්මහර,
පිළියන්දල.

*පැමිණිලිකරු*

පනාගොඩගේ තරිදු දිමුත් කුමාර මයා
230/1, දූලම්මහර, බෝකුන්දර,
පිළියන්දල.

*වින්දිත*

එදිරිව

1. පො සැ 43972 ඩබ්.ඒ.සුරංජිත් මයා
   පොලිස් ස්ථානය,
   මහරගම.

2. පො කො 92521 ඩබ්.සී.ටී.එස්.සමරසිංහ මයා
   පොලිස් ස්ථානය,
   මහරගම.

3. පොකො100223.එන්.ඒ.එස්.කේ.ජයසුන්දර මයා
   පොලිස් ස්ථානය,
   මහරගම.

4. ජී.සී. රාජපක්ෂ මයා
   හිටපු ස්ථානාධිපති
   පොලිස් ස්ථානය
   මහරගම
   ( කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව නම්කල)

*වගඋත්තරකරුවන්*

**<u>පැමිණිලි අංක : එච්. ආර්.සී/3514/22/1(Vi)</u>**

**<u>පැමිණිල්ල</u>**

පැමිණිලිකරු විසින් 2022.10.07 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, වෘත්තියෙන් ත්‍රිරෝද රථ රියදුරෙකු වන ඔහුගේ සහෝදරයා (පනාගොඩගේ තරිදු දිමුත් කුමාර), 2022.10.05 වන දින රාත්‍රී කාලයේ ඇරැව්වල ප්‍රදේශයේ කුලී

ගමනක් නිමවා ආපසු එන අතරතුර භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඇරැව්වල පිහිටි 'ෆුඩ් සිටි' (Food City) ආයතනය වෙතින් භාණ්ඩ ගෙන නැවත එන අවස්ථාවේ දී, එම ආයතනයේ සේවය කරන මුදල් අයකැමිවරියක සමඟ වින්දිතයාගේ සම්බන්ධතාවයක් පවතින්නේ යැයි ඇති වූ පෞද්ගලික සැකයක් මත, ඇයගේ පෙම්වතා ලෙස හැඳින්වෙන මහරගම පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරනු ලබන සමරසිංහ නැමැති නිලධාරියා ඇතුළු තිදෙනෙකු පැමිණ වින්දිතයා අත්අඩංගුවට ගෙන ඇති බව සඳහන් කර ඇත.

පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වන්නේ, වගඋත්තරකාර නිලධාරීන් විසින් වින්දිතයාට අත්විලංගු දමා අදාළ සේවිකාව ඉදිරියට රැගෙන ගොස් ඇයට පෙනෙන අයුරින් පහරදී , ඉන් අනතුරුව මහරගම පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් එහි වූ කාමරයක් තුළ රඳවා නැවතත් පහරදීම් සිදු කර ඇති බවත්ය. වින්දිතට පහරදී තිබෙන බව පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේ පැමිණිලිකරුට දක්නට ලැබී ඇති අතර ඒ අනුව වින්දිත වෙත ප්‍රතිකාර ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇතත් ප්‍රතිකාර ලබාදීමට කටයුතු කර නොමැති බවයි. මෙම පහරදීමෙන් පසුව වින්දිතයා සන්තකයේ හෙරොයින් මත්ද්‍රව්‍ය තිබූ බවට අසත්‍ය චෝදනා ඉදිරිපත් කර 2022.10.06 වන දින ඔහුව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පොලිසිය කටයුතු කර ඇති බවයි. ගරු අධිකරණය වෙත පොලිස් භාරයේදී සිදු වූ පහරදීම සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව වින්දිත රෝහල්ගතව ප්‍රතිකාර ලබන බව පැමිණිලිකරු සිය පැමිණිල්ල මඟින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළ වින්දිත පාර්ශවය වන පනාගොඩගේ තරිඳු දිමුත් කුමාර විසින් 2022.11.20 දිනැති ලිපිය මඟින් මෙම සිදුවීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක කරුණු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එමඟින් වින්දිතයා සඳහන් කර ඇත්තේ, 2022.10.05 වන දින රාත්‍රී කාලයේ ඇරැව්වල 'ෆුඩ් සිටි' (Food City) ආයතනයෙන් භාණ්ඩ මිලදී ගෙන නැවත නිවස බලා සිය ත්‍රිරෝද රථයෙන් ගමන් කරමින් සිටියදී, ඇරැව්වල පාසල අසලදී යතුරුපැදියකින් පැමිණි පුද්ගලයෙකු ඔහුව නතර කර ඇත. එහිදී එම පුද්ගලයා වින්දිතයාගෙන් *"උඹ කොහේද?"* යනුවෙන් විමසා ඇති අතර, වින්දිතයා තමා බොකුන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බව පැවසීමේදී *"උඹ මොකද මගේ වයිෆ් පස්සෙන් එන්නේ?"* යනුවෙන් ප්‍රශ්න කර ඇත. එම අවස්ථාවේදී දෙදෙනා අතර බහින්බස් වීමක් සිදු වී ඇති අතර, ඒ සමඟම 'ෆුඩ් සිටි' ආයතනයේ ආරක්ෂක නිලධාරීන් ද එම ස්ථානයට පැමිණ වින්දිතයා එදින ද එම ආයතනයට පැමිණි බව ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේදී අදාළ පුද්ගලයා *"උඹ දන්නවාද මම කවුද කියලා?"* යනුවෙන් විමසූ විට වින්දිතයා *"උඹ කවුරු වුණත් මට මොකද?"* යනුවෙන් ප්‍රතිඋත්තර දී ඇත. එවිට එම පුද්ගලයා වින්දිතයාට පරුෂ වචනයෙන් බැණ වදිමින්, වින්දිතයාගේ කනට දෙවරක් පහර දී ඇති අතර, ඔහුට එරෙහිව මහාධිකරණයේ නඩු පවරන බවටත්, ත්‍රිරෝද රථය රාජසන්තක කරන බවටත් තර්ජනය කර ඇත. අනතුරුව එම පුද්ගලයා දුරකථනය මඟින් අමතා අත්විලංගු යුගලක් රැගෙන එන ලෙස දන්වා ඇති අතර, විනාඩි 10-15 කට පමණ පසු සිවිල් ඇඳුමින් සැරසුණු තවත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු යතුරුපැදියකින් එම ස්ථානයට පැමිණි බව සඳහන් කර ඇත.

ඔවුන් වින්දිතයාගේ දෑතට අත්විලංගු දමා, වින්දිතයා පැමිණි ත්‍රිරෝද රථයෙන්ම ඔහුව නැවත 'ෆුඩ් සිටි' ආයතනය අසලට රැගෙන ගොස් අතින් පයින් පහර දී ඇත. එහිදී අදාළ නිලධාරියාගේ භාර්යාව යැයි හඳුන්වා දුන් තරුණිය දුව විත් පහර නොදෙන ලෙසත්, ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලෙසත් ඉල්ලා ඇති අතර, පසුව වින්දිතයාට දිගින් දිගටම බැණ වදිමින් පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඇත. පොලිස් ස්ථානය අසලදී *"බලපන් මේ බෝඩ් එක මොකක්ද?"* යනුවෙන් විමසමින් වින්දිතයාගේ බෙල්ලෙන් අල්ලා පහර දී ඇති අතර, අනතුරුව අපරාධ අංශයට රැගෙන ගොස් බිම දමා ඇඟ මත නැගී පහරදුන් බවයි. මෙලෙස පහර දෙන අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින්, ඔහු පලා යාමට උත්සාහ කළ බවත් එහිදී වැටී කකුල කැඩුණු බවත් පවසන ලෙස සඳහන් කරමින්, නිලධාරීන් සිව් දෙනෙකු පහර දී ඇති බවත්, එම පහරදීමෙන් වින්දිතයාට සිහිය නැති වූ බවත් සඳහන් වේ.

පසුව නිලධාරියෙකු වින්දිතයාගේ මුහුණට වතුර දමා ඔහුව ප්‍රකෘති තත්ත්වයට පත් කර ඇති අතර, ඔහුගේ ත්‍රිරෝද රථය මංකොල්ලකෑම් සහ සොරකම් සඳහා යොදාගන්නා එකක් බවට චෝදනා කරන බවත්, *"පැනෙන් තමා අපි වැඩේ කරන්නේ"* ද ලෙස සඳහන් කර ඇති බවයි. අනතුරුව නිලධාරියෙකු දුරකථන ඇමතුමක් ලබා දී හෙරොයින් පැකට්ටුවක් ගෙන්වා ගෙන ඇති අතර, එය වින්දිතයා සන්තකයේ තිබූ බවට ලියුම් කවරයකට ඔහුගේ අත්සන බලහත්කාරයෙන් ලබාගත් බවත්, ඉන් පසුව වින්දිතයා සිරමැදිරියට ඇතුළත් කළ බවයි. එසේම, සිය පවුලේ සාමාජිකයන්ට දුරකථන ඇමතුමක් ලබා දීමට කළ ඉල්ලීම් ද පොලිසිය විසින් ප්‍රතික්ෂේප කළ බවත් පසුව පැමිණි වෙනත් නිලධාරියෙකු මඟින් ආහාර රැගෙන එන ලෙසට කරන ලද දැනුමට අනුව 2022.10.06 වන දින අලුයම 01.20 ට පමණ ඔහුගේ සොහොයුරා පොලිසියට පැමිණ විමසීම් කළ ද අත්අඩංගුවට ගත් හේතුව සම්බන්ධව නිසි තොරතුරක් ලබා නොදී පසුදින ස්ථානාධිපතිවරයා හමුවන ලෙස දැනුම් දුන් බවයි.

පසුදින එනම්, 2022.10.06 වන දින නිලධාරියෙකු පැමිණ *"දැක්කනේ ඊයේ වෙච්ච දේ"* ලෙස පවසා දැනටමත් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා කරුණු ලේඛණගත කර ඇති බැවින් අධිකරණයේ දී වරද පිළිගන්නා ලෙස සඳහන් කර ඇත. උදෑසන වින්දිතයාගේ දෙමාපියන් පොලිසිය වෙත පැමිණි කරුණු විමසූ පසු ඔහුගේ ත්‍රිරෝද රථය, මුදල් සහ ජංගම දුරකථනය ඔවුන් වෙත භාර දී ඇත. නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ අවස්ථාවේදී ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කරුණු දැක්වීමෙන් අනතුරුව, අධිකරණ නියෝග මත ඔහුව කළුබෝවිල ශික්ෂණ රෝහල වෙත ඇතුළත් කර නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත් ඔහුගේ කණක ශ්‍රවණ තත්වයට සිදුවන හානිය සහ පාදයට ප්‍රතිකාර කරමින් තිබෙන බැවින් ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටුකරන ලෙස සහනය ලෙස අපේක්ෂා කර ඇත.

<u>**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම**</u>

1. පළමු වගඋත්තරකරු - පොලිස් සැරයන් (43672) වනසිංහ ආරච්චිගේ සුරංජිත්

2023.12.07 වන දින ප්‍රකාශයක් ලබා දෙමින්, 2018.10.02 වන දින සිට මහරගම පොලිස් ස්ථානයේ අපරාධ අංශයට අනුයුක්තව සේවය කරනු ලබන බවත්, 2022.10.05 වන දින මහරගම ස්ථානාධිපතිවරයා විසින් ලබා දෙන ලද නියෝග මත පස්වරු 20.45 ට පොලිස් කොස්තාපල් (92521) සමරසිංහ සහ පොලිස් කොස්තාපල් (100223) ජයසුන්දර යන නිලධාරීන් සමඟ අපරාධ නිවාරණ රාජකාරි සඳහා පිටව ගොස් ඇත. එදින පස්වරු 22.00 ට ඇරැව්වල මංසන්ධියේ මාර්ග බාධක රාජකාරියේ නිරතව සිටියදී, පස්වරු 22.25 ට පමණ පිළියන්දල දෙස සිට ඇරැව්වල බුඩ් සිටි ආයතනයේ වංගුවෙන් ඇරැව්වල හන්දිය දෙසට ධාවනය වූ රතු පැහැති ත්‍රිරෝද රථයක් නතර කරන ලෙස නිල ඇඳුමින් සිටි ජයසුන්දර නිලධාරියා නියෝග කර ඇත. එම අවස්ථාවේදී රියදුරු (වින්දිතයා) ත්‍රිරෝද රථය නතර කර ඇරැව්වල විද්‍යාලෝක විද්‍යාලය දෙසට දිව ගිය බවත්, ඒ අනුව ඔහු විසින් ජයසුන්දර සහ සමරසිංහ යන නිලධාරීන්ට සැකකරු លුහුබැඳ ගොස් අල්ලා ගැනීමට නියෝග කළ බවත් සඳහන් කර ඇත.

විනාඩි 20 කට පමණ පසු සහයක නිලධාරීන් දෙදෙනා විසින් සැකකරු (වින්දිතයා) ඔහු සිටි ස්ථානයට රැගෙන ආ අතර, එම අවස්ථාවේ සැකකරු කොර ගසමින් පැමිණි බවත්, ඒ පිළිබඳව නිලධාරීන්ගෙන් විමසීමේදී, සැකකරු පාසල් තාප්පයෙන් පැනීමේදී ඇද වැටී දණහිස ආබාධයකට ලක් වූ බවත්, තාප්පයෙන් පැන බිම වැටීමෙන් පසුව ද දිව යාමට උත්සාහ කරමින් නිලධාරීන් සමඟ පොර බදා ඇති බව සහයක නිලධාරීන් ඔහුට දන්වා ඇත. පසුව සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහුගේ කලිසමේ දකුණු පස සාක්කුවේ තිබී සුදු පැහැති පැකට්ටුවක් හමු වූ අතර, වසර 30 ක සේවා කාලය තුළ ලැබූ අත්දැකීම් අනුව එය හෙරොයින් බවට තමා හඳුනාගත් බව ඔහු ප්‍රකාශ කර ඇත. ඒ අනුව පස්වරු 22.45 ට වින්දිතව හෙරොයින් ළඟ තබා ගැනීමේ වරද යටතේ අත්අඩංගුවට ගෙන ඔහු සතු AAK 0627 දරන ත්‍රිරෝද රථය ද පොලිස් භාරයට ගෙන ඇත.

මහරගම පොලිස් ස්ථානය වෙත පැමිණීමෙන් පසු පස්වරු 23.20 ට අපරාධ අංශයේ ඉලෙක්ට්‍රොනික තරාදියෙන් අදාළ මත්ද්‍රව්‍ය කිරා බැලීමේදී එහි හෙරොයින් මිලිග්‍රෑම් 40 ක ප්‍රමාණයක් තිබූ බවත්, පස්වරු 23.30 ට බල අපරාධ තොරතුරු සටහන් පොතේ 240 වන පිටුවෙහි 44 වන ඡේදය යටතේ පැමිණීම සටහන් කළ බවත් සඳහන් කර ඇත. තවද, ත්‍රිරෝද රථය හා යතුරු නඩු බඩු ලේඛන කුවිතාන්සි අංක 1665/22 යටතේ ද, හෙරොයින් පැකට්ටුව නඩු බඩු ලේඛන අංක 1566/22 යටතේ ද, පුද්ගලික දේපළ කුවිතාන්සි අංක 211/22 යටතේ ද ඇතුළත් කිරීමට කටයුතු කළ බවයි. අනතුරුව සැකකරු රාත්‍රී උප සේවක පොලිස් කොස්තාපල් (91582) සමීර යන නිලධාරියා වෙත භාර දීමේදී, සැකකරු දිව යන අවස්ථාවේ ඇද වැටීමෙන් දකුණු කකුලේ දණහිස අසල ඇති වූ ආබාධය සහ ශරීරයේ මුහුණ, අත් සහ දෙපාවල පවතින සීරීම් තුවාල සහිත රතු පැහැ ගැන්වීම් පෙන්වා දී ඒ පිළිබඳව සටහන් ඇතුළත් කළ බව ද සඳහන් කර ඇත.

විමර්ශන නිලධාරි විමසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දෙමින් පොලිස් සැරයන් සුරංජිත් ප්‍රකාශ කර සිටියේ, සැකකරු තමා ඉදිරියට රැගෙන එන අවස්ථාව වන විටත් ඔහුට අත්විලංගු දමා තිබූ බවයි. සැකකරුගේ කකුලේ පවතින ආබාධය සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට තරම් අවශ්‍යතාවයක් ඒ අවස්ථාවේ තමාට නිරීක්ෂණය නොවූ බව ද ඔහු සඳහන් කර ඇති අතර, වින්දිතයා විසින් එල්ල කරනු ලබන, ෆූඩ් සිටි ආයතනයේ මුදල් අයකැමිවරියක සම්බන්ධ සිද්ධියක් පදනම් කරගෙන පහර දුන් බවට වන චෝදනාව ඔහු ප්‍රතික්ෂේප කර ඇත. සහයක නිලධාරීන් සැකකරු ලුහුබැඳ ගොස් අල්ලා ගත් කාලසීමාව තුළ සිය පූර්ණ අධීක්ෂණය පැවතියේ කෙසේද යන්න පිළිබඳව විමසීමේදී ඔහු, ත්‍රිරෝද රථය සැකකරුගේ දේපළක් බැවින් ඒ අසල රැඳී සිටි බවත්, ෆූඩ් සිටි ආයතනය ඉදිරිපිට විදුලි ආලෝකය පවතින බැවින් යම් සිදුවීමක් වූයේ නම් එය තමාට දර්ශනය විය යුතු නමුත් එවැනි කිසිදු පහරදීමක් තමා නොදුටු බවත්, සැකකරු අත්අඩංගුවට ගත් ස්ථානය ෆූඩ් සිටි ආයතනය ඉදිරිපිට මාර්ගය බවද ඔහු සඳහන් කර ඇත.

2. දෙවන වගඋත්තරකරු - පොලිස් කොස්තාපල් (92521) වී.එස්.වී. තිලිණ සංජුල සමරසිංහ

2023.12.07 වන දින ප්‍රකාශයක් ලබා දෙමින්, ඔහු 2022.10.05 වන දින පස්වරු 20.45 ට පොලිස් සැරයන් (43642) සුරංජිත් සහ පොලිස් කොස්තාපල් (100223) ජයසුන්දර යන නිලධාරීන් සමඟ පොලිස් ස්ථානයට අයත් ABV 1704 දරන ත්‍රිරෝද රථයෙන් අපරාධ නිවාරණ සංචාරයක නිරත වීම සඳහා පිටවීම බල අපරාධ තොරතුරු සටහන් පොතේ 240/43 යටතේ සටහන් කර පිටව ගිය බවත්, එම සංචාරය අතරතුර මහරගම පොලිස් බල ප්‍රදේශය තුළ විවිධ ස්ථානයන්හි මාර්ග බාධක යොදමින් සැකකටයුතු පුද්ගලයන් සහ වාහන පරීක්ෂාවට ලක් කිරීමට ඔවුන් කටයුතු කළ බව සඳහන් කර ඇත.

එදින පස්වරු 22.25 ට පමණ ඇරැව්වල ෆූඩ් සිටි ආයතනය ඉදිරිපිට මාර්ගයේ මාර්ග බාධක රාජකාරියේ නිරතව සිටියදී, පිළියන්දල දෙස සිට මහරගම දෙසට ධාවනය වූ රතු පැහැති ත්‍රිරෝද රථයක් නිරීක්ෂණය වී ඇත. එම අවස්ථාවේදී ත්‍රිරෝද රථය මාර්ගය අයිනේ නැවැත්වූ එහි රියදුරු (වින්දිතයා), රථයෙන් බැස හදිසියේ පසුපසට දිව ගිය බවත්, ඒ අනුව පොලිස් සැරයන් (43672) සුරංජිත් නිලධාරියා විසින් එම පුද්ගලයා සැකසහිත බැවින්, ඔහුව අල්ලාගෙන එන ලෙස ඔහුට සහ ජයසුන්දර නිලධාරියාට නියෝග කළ බවත්ය.

එම නියෝගය මත සැකකරු ලුහුබැඳ යාමේදී, සැකකරු ඒ ආසන්නයේ පිහිටි විද්‍යාලෝක විද්‍යාලයේ තාප්පයෙන් පැන විදුහල් භූමිය තුළට පිවිසෙනු ඔහු දැක ඇත. සැකකරු අල්ලා ගැනීම සඳහා නිලධාරීන් දෙදෙනා ද විදුහල් තාප්පයෙන් පැන ඇති අතර, එම අවස්ථාවේ සැකකරු සිය දකුණු කකුල අල්ලාගෙන කෑගසමින් සිටිනු නිරීක්ෂණය වී තිබේ. සැකකරු අල්ලා ගැනීමට උත්සාහ කිරීමේදී සැකකරු තමා සමඟ පොරබදා නැවතත් පලා යාමට උත්සාහ කළ බවත්, පසුව ජයසුන්දර නිලධාරියාගේ සහාය ඇතිව සැකකරු අල්ලාගෙන පොලිස් සැරයන් සුරංජිත් රැඳී සිටි ස්ථානය වෙත රැගෙන ඒමට ඔහු කටයුතු කළ බව සඳහන් කර ඇත.

පසුව පොලිස් සැරයන් සුරංජිත් විසින් සැකකරු පරීක්ෂා කිරීමේදී සැකකරුගේ කලිසම් සාක්කුවේ තිබී සුදු පැහැති පැකට්ටුවක් සොයාගත් බවත්, එය හෙරොයින් බවට හඳුනා ගැනීමෙන් පසු සැකකරුගේ ත්‍රිරෝද රථයෙන්ම මහරගම පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් සඳහන් කර ඇත. පොලිස් ස්ථානය වෙත පැමිණි පසු සැකකරු සතුව තිබූ මත්ද්‍රව්‍ය පාර්සලය කිරා බැලීමේදී එහි හෙරොයින් මිලිග්‍රෑම් 40 ක බරක් තිබූ බවත්, ඒ අනුව සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් බල අපරාධ තොරතුරු සටහන් පොතේ 240/44 යටතේ සටහන් තැබූ බවයි. අදාළ හෙරොයින් පැකට්ටුව නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 1666/22 යටතේ ද, ත්‍රිරෝද රථය (WP AAK 0627) සහ අනෙකුත් දේපළ 1665/22 යටතේ ද, සැකකරුගේ පෞද්ගලික දේපළ 211/22 යටතේ ද ලේඛනගත කර සැකකරු රාත්‍රී උපසේවා නිලධාරි පොලිස් කොස්තාපල් (91582) සමීර වෙත භාර දුන් බවයි.

විමර්ශන නිලධාරි විමසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් වගඋත්තරකරු, ෆුඩ් සිටි ආයතනයේ සිට ත්‍රිරෝද රථය නතර කර තිබූ ස්ථානයට මීටර් 15-20 ක පමණ දුරක් පවතින බවත්, සැකකරු පලා යාමට උත්සාහ කළ බැවින් පාසල් තාප්පය අසලදී සහ පසුව ඔහුව ත්‍රිරෝද රථය වෙත රැගෙන එන අතරතුරදී අත්විලංගු දැමීමට කටයුතු කළ බව ද, ත්‍රිරෝද රථය නතර කළ ස්ථානයේ සිට ෆුඩ් සිටි ගොඩනැගිල්ල සෘජුවම දර්ශනය නොවූවද එහි වාහන නැවතුම් ස්ථානය පැහැදිලිව පෙනෙන මට්ටමේ තිබූ බව සඳහන් කර ඇත. තව ද වින්දිතයාට තමා විසින් කිසිදු පහරදීමක් සිදු නොකළ බවත්, ඔහුගේ කකුලේ ආබාධය පිළිබඳව විමසූ විට "ප්‍රශ්නයක් නොමැති බව" වින්දිතයා පැවසූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

03. තෙවන වගඋත්තර - පොලිස් කොස්තාපල් (100223) ජේ.එම්.ඒ.එස්. කේ. ජයසුන්දර

2023.12.07 වන දින ප්‍රකාශයක් මඟින්, ප්‍රධාන පොලිස් පරීක්ෂක රමේෂ් මහතාගේ නියෝග පරිදි, පොලිස් සැරයන් (43672) සුරංජිත් සහ පොලිස් කොස්තාපල් (92521) සමරසිංහ යන නිලධාරීන් සමඟ එක්ව මහරගම පොලිස් බල ප්‍රදේශයට අයත් ඇරැව්වල ෆුඩ් සිටි ආයතනය අසල 2022.10.05 වන දින පස්වරු 22.20 ට රථවාහන රාජකාරි සහ මහජනතාව සෝදිසි කිරීමේ රාජකාරිවල නිරතව සිටි බව සඳහන් කර ඇත. මෙලෙස රාජකාරියේ යෙදී සිටියදී පිළියන්දල දෙස සිට ඇරැව්වල දෙසට ධාවනය වූ ත්‍රිරෝද රථයක් සැරයන්වරයාගේ නියෝගය පරිදි නැවැත්වීමට කටයුතු කළ අතර, එම අවස්ථාවේදී ත්‍රිරෝද රථයේ රියදුරු (වින්දිත) රථය පාර අයිනේ නතර කර ඇරැව්වල විද්‍යාලෝක විද්‍යාලය දෙසට දිව ගිය බව සඳහන් කර ඇත.

එසේම, එම අවස්ථාවේදී පොලිස් සැරයන් (43672) සුරංජිත් විසින් ඔහුට සහ සමරසිංහ නිලධාරියාට සැකකරු ලුහුබැඳ ගොස් අල්ලා ගන්නා ලෙස දැනුම් දී ඇති අතර, ඒ අනුව සැකකරු (වින්දිත) පසුපස දිව යන විට ඔහු පාසල් තාප්පයෙන් පැන විදුහල් භූමියට ඇතුළු වූ බවත්, සැකකරු තාප්පයෙන් පනින අවස්ථාවේදී *"බුදු අම්මෝ කකුල"* යනුවෙන් කෑගසන ශබ්දය ඇසුණු බව ද, ඔහු සහ සමරසිංහ නිලධාරියා ද තාප්පයෙන් පැන වින්දිත අල්ලා ගැනීමට උත්සාහ කළ බවත් ය. එම අවස්ථාවේදී සැකකරු නිලධාරීන් සමඟ පොරබදා නැවතත් පලා යාමට උත්සාහ කළ ද, මහත් පරිශ්‍රමයක් යොදා සැකකරුව අල්ලා ගැනීමට හැකි වූ බවයි.

ඉන් අනතුරුව සැකකරු පයින්ම පොලිස් සැරයන් (43672) සුරංජිත් සිටි ස්ථානයට රැගෙන ආ බවත්, තාප්පයෙන් පැනීම හේතුවෙන් සැකකරු ඒ වන විටත් නොන්ඩි ගසමින් පැමිණි බව ද. සැකකරු සෝදිසි කිරීමේදී ඔහුගේ සාක්කුවේ තිබී සුදු පැහැති පැකට්ටුවක් හමු වී ඇති අතර, එය හෙරොයින් බව පොලිස් සැරයන් (43672) සුරංජිත් විසින් හඳුනාගත් බැවින් ඔහුව අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමට පියවර ගෙන ඇත. සැකකරුගේ ත්‍රිරෝද රථයෙන් සැරයන්වරයා සහ ජයසුන්දර වන තමා සැකකරු රැගෙන ආ බවත්, පොලිස් ස්ථානයට අයත් ත්‍රිරෝද රථය සමරසිංහ නිලධාරියා විසින් පදවාගෙන පැමිණි බවත්ය.

රාත්‍රී 23.30 ට පමණ පොලිස් ස්ථානය වෙත පැමිණි පසු සැකකරු සතුව තිබූ මත්ද්‍රව්‍ය මැන කිරා බැලූ අතර, එහි හෙරොයින් මිලිග්‍රෑම් 40 ක බරක් තිබූ බවත්, ඒ අනුව හෙරොයින් ළඟ තබා ගැනීමේ වරදට

අත්අඩංගුවට ගෙන ඔහුව රාත්‍රී උප සේවක වෙත භාර දුන් බවත්ය. විමර්ශන නිලධාරි විසින් සැකකරුට අත්විලංගු දැමූ ස්ථානය පිළිබඳව විමසීමේ දී, පොලිස් සැරයන් සුරංජිත් මහතා නතර වී සිටි සැකකරුගේ ත්‍රිරෝද රථය අසලදී සැකකරුට අත්විලංගු දැමීම සිදු කළ බව සඳහන් කර ඇත.

## 04. වගඋත්තරකරුවන්ගේ ලිඛිත කරුණු දැක්වීම

මහරගම පොලිස් ස්ථානාධිපතිවරයා විසින් 2024.04.24 දිනැතිව යොමු කරන ලද ලිපිය සහ 2023.11.21ද දිනැති ලිපිය සමඟ ඉදිරිපත් කරන ලද උද්ධෘතයන්ට අනුව, ස්ථානාධිපතිවරයාගේ නියෝග ප්‍රකාරව 2022.10.05 වන දින පස්වරු 20.45 ට පොලිස් සැරයන් (43672) සුරංජිත්ගේ ප්‍රමුඛත්වයෙන්, පොලිස් කොස්තාපල් (100223) ජයසුන්දර සහ පොලිස් කොස්තාපල් (92521) සමරසිංහ යන නිලධාරීන් මහරගම පොලිස් ස්ථානයට අයත් ABV 1704 දරන ත්‍රිරෝද රථයෙන් අපරාධ නිවාරණ රාජකාරි සඳහා පිටව ගොස් ඇත (බල අපරාධ තොරතුරු පොතේ 240 පිටුව, 43 ඡේදය). එම සංචාරය අතරතුර ඇරැව්වල මංසන්ධියේදී පිළියන්දල දෙසින් ධාවනය වූ රතු පැහැති ත්‍රිරෝද රථයක් පරීක්ෂා කිරීම සඳහා නැවැත්වීමට නිල ඇඳුමින් සිටි පොලිස් කොස්තාපල් ජයසුන්දර වෙත උපදෙස් ලබා දී තිබේ.

රියදුරු (වින්දිත) එකවරම ඉඩ සිටි ආයතනය අසල රථය නතර කර ඇරැව්වල විද්‍යාලෝක මහා විදුහල දෙසට පලා ගොස් බැවින්, සැරයන් සුරංජිත්ගේ නියෝග මත ජයසුන්දර සහ සමරසිංහ යන නිලධාරීන් සැකකරු ලුහුබැඳ ගොස් ඇති අතර, සැකකරු විද්‍යාලයේ තාප්පයෙන් පැනීමට උත්සාහ කිරීමේදී බිම ඇද වැටී ඇති බවත්, ඉන් අනතුරුව ඔහු අල්ලාගෙන පොලිස් සැරයන් (43672) සුරංජිත් වෙත ඉදිරිපත් කර ඇත. සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහුගේ කලිසම් සාක්කුවේ තිබී හෙරොයින් බවට සැක කෙරෙන සුදු පැහැති පැකට්ටුවක් හමු වී, ඒ අනුව පස්වරු 22.45 ට සැකකරු අත්අඩංගුවට ගත් බවත් වගඋත්තරකරුවන්ගේ සටහන්වල දැක්වේ.

පොලිස් සැරයන් සුරංජිත්ගේ පැමිණීමේ සටහන්වල (2022.10.05 පස්වරු 23.30) දැක්වෙන්නේ, සැකකරු පලා යාමට උත්සාහ කර වැටීම හේතුවෙන් ඔහුගේ දකුණු කකුලේ දණහිස අසල ආබාධයක් සහ ශරීරයේ මුහුණ, දෙපා හා අත්වල සීරීම් තුවාල සහිත රතු පැහැ ගැන්වීම් දක්නට ලැබුණු බවයි. සැකකරු සතුව තිබූ මත්ද්‍රව්‍ය පොලිස් ස්ථානයේ ඉලෙක්ට්‍රොනික තරාදියෙන් කිරා බැලීමේදී එහි හෙරොයින් මිලිග්‍රෑම් 40ක් තිබූ බවටත්, ඒවා මුද්‍රා තබා නඩු භාණ්ඩ ලෙස ලේඛනගත කළ බවටත් වගඋත්තරකරුවන් සටහන් තබා ඇත.

කෙසේ වුවද, සැකකරු භාරගත් රාත්‍රී උපසේවා නිලධාරී පොලිස් කොස්තාපල් (91582) සමීරගේ සටහන්වල දැක්වෙන්නේ, සැකකරු පරීක්ෂා කිරීමේදී බාහිරින් පෙනෙන තුවාල කිසිවක් නොමැති බවත් දකුණු කකුලේ දණහිස අසල ආබාධයක් පමණක් පවතින බවත්ය. සැකකරු විසින් 2022.10.06 වන දින පොලිසිය වෙත ලබා දුන් බව කියන ප්‍රකාශයේ සඳහන් වන්නේ, සැකකරු මිතුරෙකුට ලබා දීම සඳහා හෙරොයින් රැගෙන ආ බවත්, පොලිසිය දැක බිය වී තාප්පයෙන් පැනීමේදී දකුණු කකුල පොළොවේ වැදී ආබාධයට ලක් වූ බවත්ය. මෙම කරුණු මත පදනම්ව වින්දිතයාට එරෙහිව හෙරොයින් මිලිග්‍රෑම් 40ක් ළඟ තබා ගැනීමේ චෝදනාව යටතේ නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ බී 8513/22 නඩුව පවරා ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාව පිළිබඳ නිරීක්ෂණ (Judicial Medical Observations)</u>

වින්දිත විසින් 2022.10.08 දින කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ලබා දී ඇති කෙටි රෝග ඉතිහාසයෙහි දැක්වෙන්නේ, *"ඇරැව්වල ඉස්කෝලේ ළඟ හන්දියේ දී මහරගම පොලීසියේ හතර දෙනෙක් මට 2022.10.05 දින රාත්‍රී 11.00ට පමණ කණට ගැහුවා. මහරගම පොලීසියට අරන් ගිහිල්ලත් ගැහුවා. එළිවෙනකම් පොලිස් කූඩුවේ තිව්වා. කුඩු පැකට් එකක් දාලා පහුවදා උසාවි දැම්මා "* ලෙස වින්දිත සඳහන් කර ඇති බවයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තොරතුරු අනුව වින්දිතයා 2022.10.06 වන දින කළුබෝවිල ශික්ෂණ රෝහල වෙත ඇතුළත් වී ඇති අතර, 2022.10.08 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් ඔහුව වෛද්‍ය පරීක්ෂණයට භාජනය කර ඇත. එහිදී වින්දිතයාගේ ශරීරයේ පහත සඳහන් තුවාල සහ ආබාධිත තත්ත්වයන් නිරීක්ෂණය වූ බව සඳහන් කර ඇත.

- වම් කනෙහි කර්ණපටහ පටලය (කන්බෙරය) පුපුරා යාම (Tympanic membrane rupture of left ear). මෙය බරපතල ගණයේ තුවාලයක් (Grievous Hurt) ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් සඳහන් කර ඇත.
- දකුණු වළලුකර ප්‍රදේශයේ සිරීම් තුවාල ලෙස දකුණු වළලුකරෙහි පිටත පාර්ශවයේ සෙන්ටිමීටර 1x1 ප්‍රමාණයේ සිරීම් පහරක් නිරීක්ෂණය වී ඇති අතර, එය බරපතල නොවන තුවාල ගණයට ඇතුළත් කර ඇත.

මෙම තුවාලයන්හි ස්වභාවය පිළිබඳව වෛද්‍ය මතය ඉදිරිපත් කරමින් අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා පෙන්වා දී ඇත්තේ, මෙම තුවාල මොට ආයුධයකින් හෝ බලයකින් (Blunt force impact) සිදුවූ ඒවා බවයි. තවද, වින්දිත පනාගොඩගේ තරිඳු දිමුත් කුමාර යන අයගේ ශරීරයේ නිරීක්ෂණය වූ මෙම වෛද්‍යමය තත්ත්වයන් ඔහු විසින් ඉදිරිපත් කරන ලද පහරදීමේ ඉතිහාසය සමඟ ඍජුවම සැසඳෙන (Consistent with the history) බව ද අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් සිය වාර්තාව මඟින් වැඩිදුරටත් සනාථ කර ඇත.

**<u>නිරීක්ෂණ</u>**

- පැමිණිල්ල මඟින් , වෘත්තියෙන් ත්‍රිරෝද රථ රියදුරෙකු වන වින්දිත පනාගොඩගේ තරිඳු දිමුත් කුමාර යන අය 2022.10.05 වන දින රාත්‍රී කාලයේ ඇරැව්වල ප්‍රදේශයේ කුලී ගමනක් නිමවා ආපසු එන අතරතුර භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඇරැව්වල 'ෆුඩ් සිටි' ආයතනය වෙත ගොස් ඇත. එහිදී පෞද්ගලික හේතුවක් පදනම් කර ගනිමින් වගඋත්තරකරුවන් ඔහුට පහර දී ඇති බවත්, පසුව ඔහුට එරෙහිව අසත්‍ය මත්ද්‍රව්‍ය චෝදනා ගොනු කර ඇති බවත් සඳහන් කර ඇත. නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 8513/22 නඩු විභාගයේදී වගඋත්තරකාර නිලධාරීන් ලබා දුන් සාක්ෂිවල පවතින ප්‍රබල පරස්පරතාවයන් සහ මත්ද්‍රව්‍ය කිරා මැනීමේ ක්‍රියාවලියේ පවතින අවිශ්වසනීයත්වය සැලකිල්ලට ගනිමින්, ගරු අධිකරණය විසින් වින්දිතයාව සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කර ඇත.

- මහරගම පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු වාර්තා පොතේ 240 වන පිටුව සහ 43 වන ඡේදය අනුව, ස්ථානාධිපතිවරයාගේ නියෝග මත 2022.10.05 දින පස්වරු 20.45 ට පොලිස් සැරයන් (43672) සුරංජිත්ගේ ප්‍රමුඛත්වයෙන් නිලධාරීන් කණ්ඩායම පිටව ගොස් ඇත. සැරයන් සුරංජිත්ගේ පැමිණීමේ සටහන්වල (පැය 23.30) දැක්වෙන්නේ, සැකකරු පරීක්ෂා කිරීමට සැරසෙන අවස්ථාවේ පලා යාමට උත්සාහ කර වැටීමෙන් ඔහුගේ දකුණු කකුලේ දණහිස ආබාධයකට ලක් වූ බවත්, ශරීරයේ මුහුණේ, අත්, දෙපා වල සීරීම් තුවාල සහිත රතු පැහැ ගැන්වීම් තිබූ බවත්ය. එහෙත්, සැකකරු භාරගත් රාත්‍රී උප සේවක පොලිස් කොස්තාපල් (91582) සමීරගේ සටහන්වල දක්වා ඇත්තේ සැකකරුගේ දකුණු කකුලේ දණහිස අසල පවතින ආබාධය හැර බාහිරින් පෙනෙන වෙනත් කිසිදු තුවාලයක් නොමැති බවයි.

තවද, පළමුවන වගඋත්තරකාර සැරයන් සුරංජිත් අධිකරණය හමුවේ පවසා ඇත්තේ ත්‍රිරෝද රථය නැවැත්වූ පසු සැකකරු පලා ගිය බව වුවද, තෙවන වගඋත්තරකාර සමරසිංහ පවසා ඇත්තේ ඔවුන් සිටි ස්ථානයට මීටර් 15-20 ක් දුරින් රථය නතර කර සැකකරු දිව ගිය බවයි. කොමිෂන් සභාවේ විමර්ශනයේදී ද නිලධාරීන් ලබා දුන් ප්‍රකාශ ද එකිනෙකට පරස්පර වේ. විශේෂයෙන්ම සැකකරුට අත්විලංගු දැමූ ස්ථානය පිළිබඳව පොලිස් කොස්තාපල් ජයසුන්දර පවසන්නේ ත්‍රිරෝද රථය අසලදී බව වුවත්, සැරයන් සුරංජිත් පවසන්නේ සැකකරු තමා වෙත ඉදිරිපත් කරන විටත් අත්විලංගු දමා තිබූ

බවයි. පොලිස් දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව අත්විලංගු දැමීමට හේතු නිල සටහන් පොතේ වාර්තා කර නොමැති වීම ද නීති විරෝධී ක්‍රියාවක් ලෙස නිරීක්ෂණය වේ.

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයේදී වගඋත්තරකාර නිලධාරීන්ගෙන් ස්වාධීන ප්‍රකාශ ලබා ගෙන ඇත. එහිදී පළමුවන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, නිල ඇඳුමින් සිටි ජයසුන්දර නිලධාරියාගේ නියෝගය මත වින්දිතයා ත්‍රිරෝද රථය නතර කර දිව ගොස් ඇරැව්වල පාසල් තාප්පයෙන් පැන ගත් බවත්, අනතුරුව පොලිස් කොස්තාපල් (100223) ජයසුන්දර සහ පොලිස් කොස්තාපල් (92521) සමරසිංහ විසින් ඔහුව අල්ලා සැරයන් සුරංජිත් වෙත රැගෙන ආ බවත්ය. එසේ වුවද, දෙවන වගඋත්තරකරු විසින් වින්දිතයා රථය පාර අයිනේ නතර කර ඇරැව්වල විද්‍යාලය දෙසට දිව ගිය බව සඳහන් කර ඇත. මේ අතර තෙවන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ වින්දිතයා හදිසියේ ත්‍රිරෝද රථය නතර කර පසුපස දෙසට දිව ගිය බවයි. වින්දිතයා පලා ගිය ආකාරය සහ දිශාව සම්බන්ධයෙන් වගඋත්තරකාර නිලධාරීන් තිදෙනා පරස්පර ප්‍රකාශයන් ලබා දී ඇත.

මෙලෙස සැකකරු පැන යාමට උත්සාහ කළ බවට නිලධාරීන් ප්‍රකාශ කරන පසුබිමක, සැකකරුට අත්විලංගු දැමූ ස්ථානය සහ අවස්ථාව සම්බන්ධයෙන් ඔවුන් ලබා දුන් ප්‍රතිඋත්තරයන්හි පරස්පරතාවක් පවතී. පොලිස් කොස්තාපල් ජයසුන්දරගේ ප්‍රකාශයට අනුව, සැරයන් සුරංජිත් නතර වී සිටි ත්‍රිරෝද රථය අසලදී සැකකරුට අත්විලංගු දමා ඇති බව සඳහන් කළ ද, පොලිස් සැරයන් සුරංජිත් ප්‍රකාශ කර සිටින්නේ සහයක නිලධාරීන් දෙදෙනා සැකකරු තමා වෙත ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් ඔහුට අත්විලංගු දමා තිබූ බවයි.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව, සිරභාරයට ගනු ලබන පුද්ගලයෙකුට අත් මාංචු දැමීම සිදු කරන්නේ නම්, එසේ කිරීමට හේතු දක්වා ස්වකීය පෞද්ගලික සටහන් පොතේ හෝ තොරතුරු පොතේ සටහන් කළ යුතු වුවද, පොලිස් සැරයන් සුරංජිත්ගේ තොරතුරු සටහන් අධීක්ෂණයේදී එවැනි කිසිදු සටහනක් ඇතුළත් කර නොමැති බව නිරීක්ෂණය විය.

වින්දිතයා පාසල් තාප්පයෙන් පැනීමේදී ඔහුගේ කකුල ආබාධිත වූ බවට නිලධාරීන් ඉදිරිපත් කරන සටහන් සහ තෙවන වගඋත්තරකරු විසින් සැකකරු තාප්පයෙන් පනින අවස්ථාවේදී "බුදු අම්මෝ් කකුල" යනුවෙන් කෑගසන ශබ්දය ඇසුණු බවට සිදු කර ඇති ප්‍රකාශයන් අනුව, වගඋත්තරකරුවන් සියලු දෙනාම සැකකරුගේ දකුණු කකුල ආබාධිත තත්ත්වයට පත්ව තිබූ බව පිළිගෙන ඇත.

කෙසේ වුවද, 2023.11.21 වන දින කොමිෂන් සභාව හමුවේ වින්දිතයා ලබා දී ඇති ප්‍රකාශය අනුව, වින්දිතව පොලිස් ස්ථානය වෙත රැගෙන යාමෙන් පසු එහි උඩුමහලට රැගෙන ගොස් ඇති අතර, එහිදී පොලිස් සැරයන් (43672) සුරංජිත් විසින් වින්දිතයාගේ පපුව මත නැගී ඔහුගේ දකුණු කකුලට සිය පාදයෙන් පහර දී ඇත. එම අවස්ථාවේදී වගඋත්තරකරු විසින් *"උඹේ කකුල කඩා දුවන විට වැටී කකුල කැඩුණු බව සටහන් කරන බව"* පවසමින් තර්ජනය කර ඇති බවත්, තවත් නිලධාරියෙකු වින්දිතයාගේ බෙල්ල පයින් පාගාගෙන සිටි බවත් සඳහන් වේ. තවද, උඩුමහලේ සිට පහළට රැගෙන එන අතරතුරදී ද වින්දිතයාගේ පිටුපසට පයින් පහරක් එල්ල කළ බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

පොලිස් ස්ථානය තුළදී පුද්ගලයන් හතර දෙනෙකු තමාට පහර දුන් බවට වින්දිතයා විසින් ප්‍රකාශ කර තිබුණ ද, වගඋත්තරකාර නිලධාරීන් අධිකරණය හමුවේ සාක්ෂි ලබා දෙමින් පළමුවන වගඋත්තරකරු ඇතුළුව නිලධාරීන් සිව් දෙනෙකු එම අවස්ථාවේ නොසිටි බව පවසමින් එම කරුණ ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ. වින්දිතයාගේ ප්‍රකාශය සහ වගඋත්තරකරුවන් අධිකරණය හමුවේ ලබා දී ඇති සාක්ෂි අතර පවතින පරස්පරතාවය මඟින් සිද්ධිය වූ අවස්ථාවේ සිටි නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ සැබෑ අනන්‍යතාවය වසන් කිරීමට වගඋත්තරකරුවන් උත්සාහ කර ඇති නිරීක්ෂණය වේ.

- වගඋත්තර නිලධාරීන් විසින් ලබා දෙන ලද ප්‍රකාශයන්ට අනුව, සැකකරු (වින්දිතයා) අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විටත් ඔහු කිසියම් ශාරීරික අපහසුතාවයකින් පසුවන බව ඔවුන්

නිරීක්ෂණය කර තිබූ පසුබිමක, ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමට ප්‍රථම හෝ රැගෙන ආ වහාම අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමට පවතින හැකියාව වගඋත්තරකරුවන් විසින් හිතාමතාම මඟහැර ඇති බව පෙනී යයි.

විශේෂයෙන්ම, සැකකරු පොලිස් රැඳවුම් භාරයේ පසුවන අතරතුර ඔහුගේ සොහොයුරා වන පැමිණිලිකරු 2022.10.06 වන දින අලුයම 01.20 ට පමණ මහරගම පොලිස් ස්ථානය වෙත පැමිණි අවස්ථාවේදී, වින්දිතයා පහරදීමකට ලක්ව ඇති බව දැක ඔහුව වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය ද, වගඋත්තරකරුවන් විසින් එම ඉල්ලීම ද කිසිදු තැකීමකට ලක් නොකර නොසලකා හරිමින් කටයුතු කර ඇත. ඒ අනුව, පොලිස් ආරක්ෂක භාරයේ පසුවන පුද්ගලයෙකුගේ සෞඛ්‍යය හා සුරක්ෂිතභාවය සහතික කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක A20 (4) මඟින් පනවා ඇති ව්‍යවස්ථාපිත යුතුකම සහ වගකීම වගඋත්තර නිලධාරීන් විසින් සිතාමතාම පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ.

- වින්දිතයා විසින් 2022.10.08 දින අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ලබා දී ඇති රෝග ඉතිහාසය පිළිබඳව අවධානය යොමු කිරීමේදී, මහරගම පොලිස් නිලධාරීන් සිව් දෙනෙකු තමාට පහර දුන් බවත්, විශේෂයෙන් සිය කනට එල්ල කළ පහරවල්වලින් පසුව තමා අසත්‍ය මත්ද්‍රව්‍ය චෝදනාවකට පටලවා සිරගත කළ බවත් ඔහු ප්‍රකාශ කර ඇත. වින්දිතයා විසින් කොමිෂන් සභාව වෙත මෙන්ම අධිකරණය වෙත ද ලබා දී ඇති ප්‍රකාශයන්හි අන්තර්ගතය සහ මෙම රෝග ඉතිහාසය අතර අනුකූලතාවයක් පවතින බව නිරීක්ෂණය කරයි.

අධිකරණ වෛද්‍ය නිරීක්ෂණවලට අනුව, වින්දිතයාගේ වම් කනෙහි කර්ණපටහ පටලය (කන් බෙරය) පුපුරා යාමකට (Tympanic membrane rupture of left ear) ලක්ව ඇති බව ස්ථිරවම තහවුරු වී ඇත. මෙම තුවාලය දණ්ඩ නීති සංග්‍රහය යටතේ 'බරපතල ගණයේ තුවාලයක්' ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් වර්ගීකරණය කර තිබේ. වින්දිතයා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත ප්‍රකාශය මෙන්ම අධිකරණය හමුවේ කරන ලද ප්‍රකාශය මඟින් ද, අත්අඩංගුවට ගත් අවස්ථාවේදී දෙවන වගඋත්තර සමරසිංහ නිලධාරියා සිය කනට දෙවරක් පහර දුන් බවට කරන ලද සඳහන් කිරීම සහ මෙම අධිකරණ වෛද්‍ය වාර්තාවේ සනාථ වී ඇති බරපතල තුවාලය අතර ඍජු අනුකූලතාවයක් පවතින බව නිරීක්ෂණය වේ.

මීට අමතරව, වින්දිතයාගේ දකුණු වළලුකර ප්‍රදේශයේ පිටත පාර්ශ්වයෙහි සෙන්ටිමීටර 1x1 ප්‍රමාණයේ සිරීම් තුවාලයක් නිරීක්ෂණය වී ඇති අතර, එය බරපතල නොවන තුවාලයක් ලෙස සටහන් කර ඇත. අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ නිගමනයට අනුව, මෙම සියලුම තුවාලයන් මොට බලයක් (Blunt force impact) මඟින් සිදු වූ ඒවා වන අතර, එම තුවාල රටාවන් රෝගියා විසින් ලබා දුන් රෝග ඉතිහාසය සමඟ සැසඳෙන බව ද අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් සනාථ කර ඇත.

පවතින වෛද්‍ය මතය ප්‍රකාරව මෙම කන්බෙරය පුපුරා යාමේ තුවාලය මොට බලයක් මඟින් එල්ල කරන ලද තදබල ප්‍රහාරයක (අතුල් පහරක් වැනි) ඍජු ප්‍රතිඵලයක් බව නිරීක්ෂණය වේ. වගඋත්තර නිලධාරීන් තිදෙනාම සිය ලිඛිත හා වාචික ප්‍රකාශ මඟින් මෙන්ම නිල සටහන් මඟින් ද තහවුරු කිරීමට උත්සාහ කරනු ලබන්නේ, වින්දිතයා පොලිසිය දැක පලා යාමට උත්සාහ කිරීමේදී පාසල් තාප්පයකින් පැන බිම ඇද වැටීම හේතුවෙන් ඔහුගේ දකුණු කකුලේ දණහිස ආබාධයකට ලක් වූ බවයි. එහෙත්, වගඋත්තරකරුවන් පවසන පරිදි තාප්පයකින් පැන බිම ඇද වැටීමක් වැනි සිදුවීමකදී කකුලට හානි සිදු විය හැකි වුවද, එමඟින් කන්බෙරය පුපුරා යාමක් වැනි බරපතල තුවාලයක් සිදු වීම විද්‍යාත්මකව හෝ තාර්කිකව පිළිගත නොහැකි බව පෙනී යයි. ඒ අනුව, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන 'තාප්පයෙන් පැන වැටීමේ' සිදුවීම හුදෙක් වින්දිතයාට පොලිස් භාරයේදී සිදු වූ මෙම පහරදීම වසන් කිරීම සඳහා නිර්මාණය කරන ලද කරුණු දැක්වීමක් බව පෙනී යයි.

- මහරගම පොලිස් ස්ථානයේ වගඋත්තරකාර නිලධාරීන් විසින් වින්දිතයා සතුව හෙරොයින් මිලිග්‍රෑම් 40ක් තිබූ බවට චෝදනා කරමින් ඔහුව අත්අඩංගුවට ගෙන තිබුණි. මෙම සිද්ධිය

සම්බන්ධයෙන් කොමිෂන් සභාව පවත්වන ලද විමර්ශනයේදී වගඋත්තරකාර නිලධාරීන් තිදෙනාම සිය ස්වාධීන ප්‍රකාශ මඟින් අවධාරණය කර සිටියේ, අදාළ මත්ද්‍රව්‍ය ප්‍රමාණය වින්දිතයා ඉදිරියේදීම පොලිස් ස්ථානය තුළදී නිසි පරිදි කිරා මැන බලා, ලියුම් කවරයක බහා මුද්‍රා තැබීමට කටයුතු කළ බවයි. නමුත්, පළමුවන වගඋත්තරකාර පොලිස් සැරයන් (43672) සුරංජිත් මහතා ප්‍රකාශ කර ඇත්තේ, සිය දීර්ඝ සේවා පළපුරුද්ද මත අදාළ ද්‍රව්‍යය හෙරොයින් බවට තමා හඳුනාගත් බවයි.

- මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු විමසමින් මහරගම පොලිස් ස්ථානාධිපතිවරයා වෙත 2022.11.15 සහ 2022.12.14 යන දිනයන්හි ලිඛිතව වාර්තා කැඳවා තිබුණ ද, එම වාර්තා ඉදිරිපත් කිරීමට ඔහු අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ. ස්ථානාධිපතිවරයා විසින් දක්වන ලද සහයෝගීතාවයෙන් තොර පිළිවෙත හේතුවෙන්, කොමිෂන් සභාව විසින් පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) වෙත මේ පිළිබඳව දැනුම් දීමට පියවර ගන්නා ලදී. එම දැනුම්දීමේ ප්‍රතිඵලයක් ලෙස 2023.04.24 වන දින ස්ථානාධිපති විසින් යොමු කරන ලද ලිපිය මඟින් මූලික කරුණු දක්වමින් දන්වා ඇත්තේ, සැකකරුට පොලිස් නිලධාරීන් පහර දුන් බවට කිසිදු පැමිණිල්ලක් පොලිස් පොත්පත්වල වාර්තා වී නොමැති බැවින්, ඒ පිළිබඳව හෝමාගම සහකාර පොලිස් අධිකාරීවරයාගෙන් වාර්තාවක් ලබා ගන්නා ලෙසයි.

තව ද, කොමිෂන් සභාවේ සිතාසි ප්‍රකාරව 2023.10.29 වන දින පවත්වන ලද විමර්ශනය සඳහා ද මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා කිසිදු සාධාරණ හේතු දැක්වීමකින් තොරව සහභාගී වීමෙන් වැළකී සිට ඇති බව නිරීක්ෂණය වේ. පසුව නුගේගොඩ කොට්ඨාශය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් 2023.04.10 දිනැතිව ලබා දෙන ලද දැනුම්දීමකට අනුව, ස්ථානාධිපතිවරයා විසින් 2023.11.21 වන දින අවශ්‍ය උද්ධෘත වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

එසේම, කොමිෂන් සභාවේ සිතාසි ප්‍රකාරව 2023.11.21 වන දින විමර්ශන කටයුතු සඳහා පෙනී සිටින ලෙස වගඋත්තරකාර නිලධාරීන් වෙත දන්වා තිබුණ ද, ඔවුන් ද එදින විමර්ශනය සඳහා සහභාගී වීම මඟහැර ඇති බව නිරීක්ෂණය වේ.

- මහරගම පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ (CIB) පිටු අංක 240 හි අන්තර්ගත දත්තයන්ට අනුව, ස්ථානාධිපතිවරයා විසින් ලබා දෙන ලද නිල නියෝග ප්‍රකාරව 2022.10.05 වන දින පැය 20.45 ට පොලිස් ත්‍රිරෝද රථයෙන් රාජකාරි සඳහා පිටත්ව ගිය නිලධාරීන් කණ්ඩායම විසින් වින්දිතයාව අත්අඩංගුවට ගෙන ඇත. වින්දිතයා පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව, වගඋත්තරකාර නිලධාරීන් විසින් ඔහුට පොලිස් ස්ථාන පරිශ්‍රය තුළදී ද පහර දී ඇති බවට ඉදිරිපත් වී ඇති කරුණු සහ වින්දිතයාගේ ශරීරයේ නිරීක්ෂණය වූ තුවාල රටාවන් එම ප්‍රකාශය සමඟ අනුකූලතාවයක් දක්වන බව නිරීක්ෂණය වේ.

තව ද, පොලිස් ස්ථානය වෙත රැගෙන ආ වින්දිතයාගේ ත්‍රිරෝද රථය අංක 1665/22 දරන බඩු භාරගැනීමේ කුවිතාන්සිය යටතේ 'නඩු භාණ්ඩයක්' වශයෙන් නිසි පරිදි ලේඛනගත කර තිබියදීත්, එය නීත්‍යානුකූලව අධිකරණය වෙත ඉදිරිපත් නොකර 2022.10.06 වන දින වින්දිතයාගේ සහෝදරයා වෙත මුදා හැරීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණය හමුවේ කරුණු විමසීමේදී, ස්ථානාධිපතිවරයාගේ නියෝගය මත අදාළ වාහනය මුදා හළ බවට වගඋත්තරකරුවන් විසින් සාක්ෂි ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

පොලිස් ස්ථානයක සමස්ත පාලනය, විනය සහ අධීක්ෂණ බලතල ක්‍රියාත්මක කරන ප්‍රධානියා ලෙස ස්ථානාධිපතිවරයා සිය යටත් නිලධාරීන්ගේ හැසිරීම් සහ ඔවුන් සිදු කරනු ලබන වෘත්තීය විෂමාචාරයන් සම්බන්ධයෙන් වන 'අධීක්ෂණ වගකීමෙන්' සෘජුවම බැඳී සිටියි. මෙම සිදුවීමට අදාළ වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම පැහැර හැරීම හෝ ප්‍රමාද කිරීම තුළින් ද, විමර්ශන සඳහා සහභාගී වීම මඟහැරීම තුළින් ද, වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද මෙම අනීතික ක්‍රියාව වසන් කිරීමට හෝ ඊට වක්‍රව සහය සහ අනුබල ලබා දී ඇති බවට ස්ථානාධිපතිවරයා වගකීමට යටත්වේ.

මෙම සමස්ත කරුණු සහ විමර්ශන දත්තයන් සැලකිල්ලට ගනිමින්, මහරගම පොලිස් ස්ථානාධිපතිවරයා ද මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවකු ලෙස නම් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

- ***අමල් සුදත් සිල්වා එ.පො.ප කොඩිතුවක්කු නඩුව මෙන්ම ඩිල්ෂාන් තිලකරත්න සහ වයි කුමාරිහාමි එ.සාජන් ඩග්ලස් ඇල්ලේපොල සමග වෙනත් අය (SCFR 578/2011)*** නඩුවේදී පුද්ගලික නිදහස සහ ආරක්ෂාව පිළිබඳ නිදහස සහ ආරක්ෂාව පිළිබඳව ව්‍යවස්ථාමය සහතිකය භුක්ති විඳිමට අයිතිය තිබිය යුතු අතර, සුප්‍රකට හෝ දරුණු අපරාධකරුවන් පවා වධහිංසාවට අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට ලක් නොවීමේ අයිතිය නීතිය අනුව පවතින බව දක්වා ඇත.

- ***බන්දුල සමරසේකර එ. විජිත අල්විස් ඕ.අයි.සී ගිනිගතේන පොලිස් ස්ථානය (SriLR 213)*** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන්නේ, පොලිස් නිලධාරියෙකුගේ ප්‍රධානතම යුතුකම වන්නේ සියලු අපරාධ සහ මහජන පීඩා වැළැක්වීමට සහ මහජන සාමය ආරක්ෂා කිරීමට සිය උපරිම ශක්තිය යෙදවීම බවයි. සිය රාජකාරිය ඵලදායී ලෙස ඉටු කිරීමට නම් මහජන විශ්වාසය සහ ගෞරවය දිනාගත යුතු අතර, ඒ සඳහා සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු වනවාට වඩා උසස් සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතු විය යුතු බව එහිදී වැඩිදුරටත් දක්වා ඇත.

- තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධික්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් තුරෙයි රාජා විනිසුරුතුමා විසින් ***ආර්.ඒ.ඉරේෂා ලක්මාලි එ. නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය තවත් කොට්ඨාශය හ 45 අය (SCFR/505/19)*** නඩුවේ දී දක්වා ඇත.

- ***ගනේෂන් සැමසන් රෝයි. එදිරිව - එම්.එම්,ජනකු මාරසිංහ. ස්ථානාධිපති අපරාධ විමර්ශන දෙපාරතමේන්තුව SCFR 405/2018*** නඩුවේදී ද දක්වා ඇත්තේ චෝදනාව විශ්වාස කළ හැකි බවට මතයක් ගොඩනගා නොගෙන, ලැබුණු පැමිණිල්ලක් මතම යාන්ත්‍රිකව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරීන්ට කල නොහැකි බවත්, පැමිණිල්ල විශ්වාස කල හැකිද නැතහොත් ලබා දී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට කරුණු පැහැදිලි නම් මිස අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පොලිස් නිලධාරීන් ක්‍රියාත්මක විය යුතු බවයි.

<u>නිගමනය</u>

කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය වාර්තාව (MLEF 292/25) මගින් වින්දිතයාගේ වම් කනෙහි කර්ණපටහ පටලය (කන් බෙරය) පුපුරා යාමකට ලක්ව ඇති බවට වූ විද්‍යාත්මක සාක්ෂිය සහ එම තුවාලය මොට බලයක් මගින් සිදු වූ පහරදීමකට අනුකූල බවට වූ වෛද්‍ය මතය වී ඇත. මෙම වෛද්‍ය නිගමනය, වින්දිත තරිඳු දිමුත් කුමාර විසින් කොමිෂන් සභාව සහ අධිකරණය හමුවේ ලබා දෙන ලද ප්‍රකාශයන්හි සඳහන් වන දෙවන වගඋත්තරකාර සමරසිංහ නිලධාරියා "පෞද්ගලික අමනාපයක් මත සිය කනට දෙවරක් පහර දුන් බව" සහ පළමුවන වගඋත්තරකාර පොලිස් සැරයන් සුරංජිත් විසින් පොලිස් ස්ථානය තුළදී "සිය පපුව මත නැගී දකුණු කකුලට පහර දෙමින්, උඹේ කකුල කඩා දුවන විට වැටී කකුල කැඩුණු බවට නඩු පවරන බව පවසා තර්ජනය කළ බව" යන කරුණු සමඟ අනුකූල වන බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් සඳහන් කර ඇති පරිදි පාසල් තාප්පයකින් පැන බිම ඇද වැටීමකදී කකුලට හානි සිදු විය හැකි වුවද, කන් බෙරය පුපුරා යාමක් වැනි බරපතල තුවාලයක් ඇති විය නොහැකි බවත්, එය

හුදෙක් පහරදීම වසන් කිරීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රකාශයක් බවත් අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් තහවුරු වේ. ඒ අනුව, වගඋත්තරකාර 01, 02 සහ 03 යන පොලිස් නිලධාරීන් විසින් වින්දිතයාට පහර දී ඇති බව සිද්ධිමය සාක්ෂි මඟින් තහවුරු වන බැවින්, ඔවුන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති "වධහිංසාවලින් හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

මෙම අත්අඩංගුවට ගැනීම සාධාරණ සැකයක් හෝ නීත්‍යානුකූල අවශ්‍යතාවක් මත පදනම් වූවක් නොව, තෙවන වගඋත්තරකාර සමරසිංහ නිලධාරියාගේ පෞද්ගලික අමනාපයක් මත සිදු වූවක් බව සාක්ෂි අනුව පෙනී යන අතර, ඒ අනුව වගඋත්තරකරුවන් විසින් නීතිමය පටිපාටියෙන් හා විධිමත් විමර්ශනයකින් තොරව අත්තනෝමතික ලෙස වින්දිත අත්අඩංගුවට ගැනීම මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සහ 13(2) වගන්ති මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

වින්දිතයා අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විටත් ඔහු කායික අපහසුතාවයකින් පසුවන බව වගඋත්තරකරුවන් විසින්ම පිළිගෙන ඇති පසුබිමක, වින්දිතයාගේ සොහොයුරා පොලිස් ස්ථානයට පැමිණ ප්‍රතිකාර ඉල්ලා සිටියදීත් එය සිතාමතාම නොසලකා හරිමින් කටයුතු කිරීම තුළින්, පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක A20 (4) මඟින් පනවා ඇති ව්‍යවස්ථාපිත වගකීම වගඋත්තරකරුවන් විසින් පැහැර හැර ඇත.

තව ද, මහරගම පොලිස් ස්ථානාධිපතිවරයා කොමිෂන් සභාවේ විමර්ශන සඳහා සහභාගී වීම දිගින් දිගටම මඟහැරීම, විමර්ශන වාර්තා සැපයීම අනිසි ලෙස ප්‍රමාද කිරීම සහ සිය යටත් නිලධාරීන්ගේ සාපරාධී ක්‍රියාවන් පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම තුළින් ඔහු සිය අධීක්ෂණ වගකීම පැහැර හැර තිබීම පමණක් නොව, මෙම අනීතික ක්‍රියාවන් වසන් කිරීමට වක්‍රව සහය සහ අනුබල ලබා දීම තුළින් හතරවන වගඋත්තර ස්ථානාධිපතිවරයාද වින්දිතයාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ වගකීමට බැඳෙන බව පෙනී යයි.

ඒ අනුව, පළමුවන වගඋත්තරකාර වනසිංහ ආරච්චිගේ සුරංජිත්, දෙවන වගඋත්තරකාර තිළිණ සංජුල සමරසිංහ සහ තෙවන වගඋත්තරකාර ජේ.එම්.ජ්.එස්.කේ. ජයසුන්දර යන නිලධාරීන් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මෙන්ම 13(1) සහ 13(2) ව්‍යවස්ථා උල්ලංඝනය කර ඇති බවත්, එසේම, හතරවන වගඋත්තරකාර ජී.සී. රාජපක්ෂ යන මහරගම පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපතිවරයා විසින් සිය අධීක්ෂණ වගකීම පැහැර හරිමින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති, නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව ලැබීමේ අයිතිය උල්ලංඝනය කර ඇති බවටත් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත නිර්දේශ ඉදිරිපත් කර සිටී.

01. නිරීක්ෂණය වන ආකාරයට පෞද්ගලික අමනාපයක් මත මෙම අත්තනෝමතික ක්‍රියාව ආරම්භ කිරීම සහ වින්දිතයාගේ වම් කනට පහර දී කන්බෙරය පුපුරා යාම යන බරපතල තුවාලය සිදු කිරීමෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 මෙන්ම නීතියට පරිබාහිරව හා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම මඟින් 13(1) සහ 13(2) ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමේ වගකීම පැවරෙන දෙවන වගඋත්තරකාර තිළිණ සංජුල සමරසිංහ විසින් රු. 50,000.00 මුදලක් වින්දිතට ගෙවිය යුතුය.

02. විමර්ශන කණ්ඩායමේ ප්‍රධානියා ලෙස සිටියදී වධහිංසාව වැළැක්වීමට පියවර නොගැනීම, වින්දිතයාගේ පපුව මත නැගී ඔහුගේ කකුලට පහර දීම සහ අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් තර්ජනය කිරීමෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මෙන්ම නීතියට පරිබාහිරව හා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම මඟින් 13(1) සහ 13(2) ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

හේතුවෙන් පළමුවන වගඋත්තරකාර වනසිංහ ආරච්චිගේ සුරංජිත් විසින් රු. 50,000.00 මුදලක් වින්දිතට ගෙවිය යුතුය.

03. අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමට ඍජුව සහභාගී වීම, සාක්ෂි විකෘති කිරීම සහ නිල සටහන් පරස්පර ලෙස තැබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මෙන්ම නීතියට පරිබාහිරව හා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම මඟින් 13(1) සහ 13(2) ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම හේතුවෙන් තෙවන වගඋත්තරකාර ජේ.එම්.ජී.එස්.කේ. ජයසුන්දර රු. 50,000.00 මුදලක් ගෙවිය යුතුය.

04. වින්දිතයා අසාධ්‍ය තත්ත්වයෙන් සිටියදී ඔහුට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම පැහැර හැරීම (A20 නියෝග උල්ලංඝනය), සිය නිලධාරීන්ගේ නීතියට පටහැනි අත්අඩංගුවට ගැනීම් හා පහරදීම් සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීම පැහැර හැරීම සම්බන්ධයෙන් මහරගම පොලිස් ස්ථානාධිපතිවරයා විසින් රු. 50,000.00 මුදලක් ද වන්දි ලෙස ගෙවිය යුතුය.

05. සිය යටත් නිලධාරීන්ගේ සාපරාධී ක්‍රියාවන් පාලනය කිරීමට අපොහොසත් වීම, විමර්ශන වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම සහ විමර්ශන මඟහැරීම හා අධීක්ෂණ වගකීම පැහැර හැරීම හා සත්‍ය වසන් කිරීමට කටයුතු කිරීම සම්බන්දයෙන් සම්බන්ධයෙන් හතරවන වගඋත්තර ජී.සී. රාජපක්ෂ හිටපු මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඔහුට විරුද්ධව පොලිස්පතිවරයා සුදුසු පියවර ගත යුතුය.

06. වින්දිතයාට වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් 1994 අංක 22 දරන වධහිංසා පැමිණවීමට එරෙහි සම්මුති පනත යටතේ පළමුවන, දෙවන සහ තෙවන වගඋත්තරකාර නිලධාරීන්ට එරෙහිව නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය පියවර පොලිස්පතිවරයා ගතයුතුය.

2026 .07.22 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් : | 01. | අමාත්‍යතුමා<br>ආරක්ෂක අමාත්‍යාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ. | - | කරුණු දැන ගැනීම සඳහා |
| | 02. | පොලිස්පතිතුමා,<br>පොලිස් මූලස්ථානය,<br>කොළඹ 02. | - | නිර්දේශය ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා |

සැ.යු. : අදාළ වන්දි මුදල "මුදල් ඇණවුමක්" මඟින් ගෙවා එහි පිටපත කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුයි.